සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2024 (2025)
இறுதி தவணைப் பரீட்சை - 2024 (2025) / Year End Term Test - 2024 (2025)

| | | |
|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 6 ශ්‍රේණිය | පුරවැසි අධ්‍යාපනය I, II | කාලය / நேரம் / Time: පැය 2 යි |

නම / பெயர் / Name ..............................  විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ..............................

## I කොටස

**සියලුම ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.**

**ප්‍රශ්න අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. ඔබේ පාසලේ ඉතිහාසය පිළිබඳ තොරතුරු සොයා ගැනීමට උපකාරී වන මූලාශ්‍රයක් නොවන්නේ,
    (1) පාසලේ විවිධ ස්ථානවල ඇති සමරු ඵලක
    (2) පාසලේ සංවිධාන ව්‍යුහය
    (3) පාසලේ පවත්වාගෙන යන ලොග් පොත
    (4) විශ්‍රාමික විදුහල්පතිවරු ගුරුවරුන්ගෙන් ලබාගත හැකි තොරතුරු

02. A අධ්‍යාපන කටයුතුවල නියමුවා ලෙස ක්‍රියා කිරීම.
    B පාසල් වාර පරීක්ෂණ පවත්වා ලකුණු ලබා දීම.
    C පාසල් භූමියේ පවිත්‍රතාවය හා අලංකාරය පවත්වා ගැනීම.
    D ඉගැන්වීම් කටයුතු අධීක්ෂණය

    ඉහත ප්‍රකාශ වලින් විදුහල්පතිගේ කාර්යභාරයට අයත් වනුයේ,
    (1) B හා C  (2) A හා B  (3) A හා D  (4) C හා D

03. සැලසුම් සහගත ශිෂ්‍යයා සතු ලක්ෂණයක් වනුයේ,
    (1) අභියෝග වලට මුහුණ දීම අපහසු වේ.
    (2) වැඩ කල් දමයි.
    (3) තම අරමුණු ඉටු කර ගනියි.
    (4) ආතතියෙන් යුතුව වැඩ කටයුතුවල යෙදෙයි.

04. ආචාර්ය සී.ඩබ්.ඩබ්. කන්නන්ගර මැතිතුමා සම්බන්ධ ප්‍රකාශය තෝරන්න.
    (1) දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ අහංගම කතලුව ගම්මානයේ දී උපත ලැබීය.
    (2) මහනුවර ත්‍රිත්ව විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය හදාරන ලදී.
    (3) දරුවන්ට මව් භාෂාවෙන් අධ්‍යාපනය ලබා දීම හා මධ්‍ය විද්‍යාල පිහිටුවීම.
    (4) රෝගීන්ට අත්‍යවශ්‍ය බෙහෙත් සහන මිලට ලබා දීමට කටයුතු කරන ලදී.

05. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් මගින් ඉටු කරනු ලබන සේවාවකි.
    (1) ජල මාර්ග ප්‍රතිසංස්කරණය හා කැලිකසළ ඉවත් කිරීම.
    (2) වීදි ලාම්පු නඩත්තු කිරීම.
    (3) පොදු වෙළෙඳපොළ, නගර උද්‍යාන, පුස්තකාල පවත්වාගෙන යාම.
    (4) උප්පැන්න සහතික නිකුත් කිරීම.



LIVEWORKSHEETS

**අංක 06 සිට 10 දක්වා ප්‍රකාශ නිවැරදි නම් (✓) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.**

06. පාසලේ සංවර්ධන කමිටුවේ සභාපතිවරයා විදුහල්පතිවරයා වේ. (..............)

07. ශ්‍රී ලංකාවේ කුඩාම පරිපාලන ඒකකය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය වේ. (..............)

08. ශ්‍රී ලංකාවේ පරිපාලන දිස්ත්‍රික්ක සංඛ්‍යාව 22 කි. (..............)

09. මහනගර සභාවක ප්‍රධානියා වන්නේ නගරාධිපති ය. (..............)

10. සේනක බිබිලේ මහතා ඖෂධ ප්‍රතිපත්තිය හඳුන්වා දෙන ලදී. (..............)

**අංක 11 සිට 15 දක්වා ප්‍රශ්න සඳහා වරහන් තුළ දී ඇති පිළිතුර සහිත වචන වලින් නිවැරදි පිළිතුර සහිත වචනය හිස්තැන් මත ලියන්න.**

විනය / පළාත් / චාරිත් / නිර්මිත පරිසරය / පාසල් කොඩිය

11. ශ්‍රී ලංකාව ............................................ නවයකට බෙදා තිබේ.

12. සමාජ සම්මතයට අනුව කටයුතු කිරීම හා නීතිරීති අනුගමනය කිරීම ............................................ ලෙස හැඳින්වේ.

13. අප විසින් නොකළ යුතු දේ ............................................ ලෙස හැඳින්වේ.

14. පාසලේ අනන්‍යතාව පෙන්නුම් කරන සංකේතයක් ලෙස ............................................ වැදගත් වේ.

15. මිනිසා ස්වභාවික පරිසරයෙහි නිර්මාණය කළ දෑ ............................................ අයත් වේ.

**ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න සඳහා A කොටසේ ප්‍රකාශයට වඩාත් නිවැරදි පිළිතුර B කොටසින් තෝරා අදාළ අක්ෂරය වරහන තුළ යොදන්න.**

| A කොටස | | | B කොටස |
|---|---|---|---|
| 16. තම අදහස් ඉදිරිපත් කිරීම අයිතිවාසිකමකි. | (   ) | A | සම්ප්‍රදායක් වේ. |
| 17. නිවැරදි ඉරියව්වල පිහිටා කතා කිරීම. | (   ) | B | සෙසු අයගේ අදහස්වලට ගරු කිරීම යුතුකමකි. |
| 18. සක්‍රීය සවන් නොදීමෙන් | (   ) | C | රීති වේ. |
| 19. අතීතයේ සිට පැවත එන සමාජ සම්මතයකි. | (   ) | D | ආචාරශීලී කථනයේ අංග ලක්ෂණයකි. |
| 20. නොකළ යුතු බව සම්මතයේ ඇති කොන්දේසි සමූහය | (   ) | E | සැකය සහ අවිශ්වාසය ගොඩ ගොඩනැගීමට ඉඩ ඇත. |
| | | F | සිරිත් වේ. |

(ලකුණු 2 × 20 = 40)



LIVEWORKSHEETS